# ගොවිතැනට ආධාරයක් වන න්‍යෂ්ටික තාක්ෂණය

කර්මාන්ත ක්ෂේත්‍රයේදී පරිසර දූෂණය පාලනය කිරීම, සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම, බලශක්ති අරපිරිමැසුම, අපතේ යාම වලක්වාලීම නිෂ්පාදන පිරිවැය පහත දැමීම, භාණ්ඩවල තත්ත්වය උසස් කිරීම ආදී කාර්යයන් රැසක් සඳහා අද අප න්‍යෂ්ටික වැඩමාලාව මහෝපකාරී වෙයි. සෞඛ්‍ය සේවාවේ දී රෝගියාගේ ආරක්ෂාව උදෙසා ලේ ශරීරගත කිරීමට පෙරාතුව රුධිර පරීක්ෂාව පිළිකා ප්‍රතිකාර, කල්වේලා ඇතිව පිළිකා රෝගය නිශ්චය කිරීම වැනි වෙනත් ක්‍රම මගින් නිශ්චය කළ නොහැකි වන අපහසු රෝග විනිශ්චය කටයුතු වැනි දේ සඳහා එම ශිල්ප ක්‍රම ප්‍රයෝජනවත් වෙයි. කෘෂිකර්මයේදී න්‍යෂ්ටික තාක්ෂණය උපකාරී වන්නේ, වඩා හොඳ බෝග මාදිලි බෝ කිරීමටත්, පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය නංවාලීමටත්, වගා වන් හි පසෙහි තෙතමනය මට්ටම පවත්වාගෙන යාමටත්, පැළෑටි රෝග අධ්‍යයනය හා ඒවා මර්දනයටත්, වගාවන් වැඩි දියුණු කිරීම සඳහා පොදු පර්යේෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමේ ක්‍රියා වලින ආදියටය. ජල සම්පත් සංවර්ධනයේදී විශේෂයෙන් භූගත ජලය සොයා ගැනීමේදී මෙම තාක්ෂණය ශ්‍රී ලංකාවේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ඉඩම් පරිහරණයේදී විශේෂයෙන්ම ආරම්භයේදීම පස සෝදී හා රොන් මඩ තැන්පත් වීමේ (අවසාදනය) ප්‍රමාණයන් මැනීමේ එකම ප්‍රමාණාත්මක ක්‍රමය ද එය වේ. පුරාවිද්‍යා ක්ෂේත්‍රයේදී කැණීම් වලදී හමුවූ නානා මාදිලියේ බොහෝ අගනා පුරාවස්තු ගණනාවකම කාල නිර්මාණය කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සහ සංඛ්‍යානික ත්‍රිකෝණ ව්‍යාපෘතියට අපි සහාය වීමු. සත්ව පාලන යේදී සංවර්ධනය වන රට වල මස් හා කිරි ලබාගැනීමේ ප්‍රභවයන් ලෙසත,, නිසග බලය ලබා ගැනීමේ මාර්ගයක් ලෙසත මහෝපකාරී වන ගීලෑමී ගව සම්පත් ජනනය හා උන්ගේ පෝෂණය පිළිබඳ තත්ත්වයන් වැඩි දියුණු කිරීමට මේ ශිල්ප ක්‍රම උපකාරීවේ.

විවිධ කාර්යයන් සඳහා න්‍යෂ්ටික තාක්ෂණය භාවිත කරන්නාවූ වෛද්‍ය, කෘෂි කාර්මික හා කාර්මික ආයතන 44 කට වැඩි ප්‍රමාණයක් අද පවතී. ඉදිරි වසර කීපය තුළදී ශ්‍රී ලංකා වාසී පොදු ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමටත් ජීවන වියදම් අඩුකරලීමටත්, තවත් බොහෝ මාර්ග වලින් න්‍යෂ්ටික තාක්ෂණය උදව් වනවා ඇත.

ආචාර්ය

ග්‍රැන්විල් ධර්මවර්ධන

විසිනි

සුරක්ෂිතතාව පිළිබඳ ක්ෂේත්‍රයේදී න්‍යෂ්ටික විද්‍යාඥයෝ නිතරම ඉදිරියෙන් හා පොදු ජනතාව සා එක්ව පෙරමුණ ගෙන සිටිති. ශ්‍රී ලංකාව ආනයනය කරන ලද ආහාරවල විකිරණශීලී ද්‍රව්‍ය මුසු වී ආහාර දූෂණය වීමට තුඩු ඉඩ ප්‍රස්ථාව පිළිබඳ ප්‍රශ්න යේදී ඇතැම් දියුණු රට විලින් එල්ල වූ අභියෝග මධ්‍යයේ වුවද, අප ක්ෂණිකව හා දැඩිව ගත් ස්ථිරසාර පියවරවල් මෙහිලා කදිම නිදසුනක් ලෙස පෙන්වා දිය හැකිය කෙසේ වුවද,

එක් ආහාර ද්‍රව්‍ය සැපයූ රටවල් අපගේ හැකියාවනත්, අප විසින් භාවිත කරන ලද ඉතාමත් නවීන ශිල්ප ක්‍රමත් පිළිබඳව දැනගැනීමෙන් පසුව එවැනි අභියෝග පසෙක ලා ශ්‍රී ලංකාවට න්‍යෂ්ටික විෂ ද්‍රව්‍යයන්ගෙන් දූෂිත ආහාර ද්‍රව්‍ය කිසිවක් නැව් ගත නොකිරීමට වග බලා ගත්හ. එසේම මාලදිවයිනට ආනයනය කළ ආහාර ද්‍රව්‍යද අප විසින් පරීක්ෂණයට භාජනය කරන ලදින් එම රටටද එවැනි දූෂිත ආහාර නොඑවීමට සැපයුම්කරුවෝ ප්‍රවේශම් වූහ. මේ කරුණ සම්බන්ධයෙන් නිසි පියවර ගත් පෙරදිග රටවල් අතුරින් ද ප්‍රථම රට අප ශ්‍රී ලංකාව විය. එම දැනුම ඇති වෙනත් රටවල් ද මේ අනුවම පසුව ක්‍රියා කළේය.

කුඩා න්‍යෂ්ටික ප්‍රතික්‍රියා කාරකයක් රැගත් කොස්මොස් 945 උඩුගුවන් විමන මීට වසර 4 කට පෙර දී පොළොව මත කඩා වැටීමේ අවදානම් උද්ගතවූ අවස්ථාවේදී කල් තබාම එවැනි අනතුරක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා අපි සූදානම්ව සිටියෙමු. කිසියම් හඳුනා නොගත් වස්තුවක් අහසින් පොළොව මත පතිත වුවහොත් ගත යුතු ක්‍රියා මාර්ගය ගැන දිවයිනෙහි සියලුම පොලිස් ස්ථානවලට අපි දැනුම දුනිමු. ඇත්ත වශයෙන්ම, ගිනි බෝලයක් අහසින් විත් මාවතගමට පතිත වූ වේලේ (මෙය පත්තු කොට එවන ලද විශාල සංඥා ගිනි බෝලයක් බව පසුව අනාවරණය විය.) අප කල් තබා සූදානම් ව සිටි හෙයින් හදිසි අවශ්‍යතාවයන් මතු වූ ස්ථානයකට වහාම ගොස් එය කුමක් දැයි පරීක්ෂා කිරීමේ අපගේ හැකියාව තහවුරු විය. එදා සෙනසුරාදා සවස් යාමයක වුවද, කොළඹින් සැතපුම් 60 ක් පමණ දුරින් පිහිටි මාවතගම නගරයට අප කණ්ඩායම පැය කීපයක් ඇතුළත ළඟා වූයේ එය ඇත්ත වශයෙන්ම චන්ද්‍රිකාවක කැබැල්ලක් වුවද ඒවා ඉවත් කොට ප්‍රදේශය පවිත්‍ර කොට මහජනයාගේ ආරක්ෂාව සහතික කිරීමට අවශ්‍ය උපකරණ හා අවශ්‍ය බඩු බාහිරාදිය අප විසින් කල් තබා දෙන ලද උපදෙස් පිළිපදිමින් ඉතාම නිවැරදි ලෙසත් වගකීම් සහිතවත් මෙහිදී පොලිසිය හා මහජනයා ක්‍රියා කළ බව සඳහන් කළ යුතුය.



මෙබඳු උසස් තත්ත්වයේ බීජ නිපදවීමට න්‍යෂ්ටික තාක්ෂණය උපකාරීවේ.